# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.25 පැය 0830 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1940/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මාර්ගයේ වැටී තිබූ මුදල් පසුම්බියක් එහි බ්‍රිතාන්‍ය ජාතික හිමිකාරිණිය සොයා භාර දීම - අගමැති ආරක්ෂක කොට්ඨාසය.**

2025.10.23 වන දින නාරාහේන්පිට තිඹිරිගස්යාය මාර්ගයේ වැටී තිබූ මුදල් පසුම්බියක් එහි හිමිකාරිණිය සොයා භාර දීමට අගමැති ආරක්ෂක කොට්ඨාසයට අනුයුක්ත කාන්තා පොලිස් පරීක්ෂක යමුනා ධම්මිකා කුමාරි එදිරිසිංහ හා කාන්තා පොලිස් කොස්ථාපල් 12093 සමන්මලී යන නිලධාරීනියන් විසින් කටයුතු කර ඇත. එහි හිමිකාරිණිය බ්‍රිතාන්‍ය ජතික සබ්‍රිනා කැමරන් මහත්මිය වන බවට අනාවරණය වූ අතර ඇය අගමැති ආරක්ෂක කොට්ඨාසයට කැඳවා එහි අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුමිත්‍ර ද සිල්වා මහතා විසින් භාර දීමට කටයුතු කර ඇත.

මෙම මුදල් පසුම්බියෙහි ශ්‍රී ලංකා මුදල් රුපියල් හය දහසක් හා ලංකා මුදලින් රුපියල් ලක්ෂ 06 ක පමණ වටිනා (යුරෝ, ඇමරිකානු ඩොලර්, ස්ටර්ලිං පවුම්) විදෙස් මුදල් තිබූ අතර එහි දේශීය හා විදේශීය ක්‍රේඩිට් කාර්ඩ්පත්, ජාත්‍යන්තර රියදුරු බලපත්‍රය, හැඳුනුම්පත හා වටිනා ලියකියවිලි කිහිපයක්ද තිබී ඇත.

මෙම නිලධාරීණියන්ගේ අවංක ක්‍රියා කලාපය සම්බන්ධව බ්‍රිතාන්‍ය ජාතික කාන්තාව විසින් එම නිලධාරීණියන්ටත්, ශ්‍රී ලංකා පොලිසියටත්, අගමැති ආරක්ෂක කොට්ඨාසයටත් ස්තූතිය ප්‍රකාශ කර ඇත.

මෙම මුදල් භාර දීමේ අවස්ථාවට අදාල වීඩියෝ පටය හා ඡායාරූප



පොලිස් මාධ්‍ය කොට්ඨාසය